**කොටගල ප්‍රාදේශීය සභාව - 2022**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කොටගල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කොටගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මං දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් **විගණන** වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය

සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය  ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව  ප්‍රාදේශීය සභාවේ  කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ   ප්‍රාදේශීය සභාව  විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව,  ප්‍රාදේශීය සභාව  ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොටගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව පවරා ඇති නඩු 04 සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2023.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන සකස් කරන අවස්ථාවේදී හෙළිදරව් කිරීමට කටයුතු කරන බව | මූල්‍ය ප්‍රකාශනවල තොරතුරු හෙළිදරව් කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයට අදාළ රු.669,600 ක දැන්වීම් පුවරු ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායම් සේ සලකා ගිණුම්ගත කර තිබුණු අතර වර්ෂයට අදාළ ලැබිය යුතු දැන්වීම් පුවරු ආදායම් රු.310,400 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2023.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන සකස් කරන අවස්ථාවේදී නිවැරදි කරන බව | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබුණු මුද්දර බදු ආදායම රු.2,506,257 ක් අඩුවෙන්ද, ලැබිය යුතු මුද්දර ගාස්තු රු.951,378 ක් වැඩියෙන්ද, ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.2,406,257 ක් වැඩියෙන්ද ගිණුම්ගත කර තිබුණි. | - එම - | - එම - |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළ උසාවි දඩ ආදායම් රු.4,462,667 ක් වැඩියෙන් දැක්විණි. | - එම - | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති රු.680,268 ක් වූ ණය හිමි ශේෂ 15 ක් ණයහිමියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | - එම - | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |
| (ඉ) | සංවර්ධන ව්‍යාපෘති ගිවිසුම් වටිනාකමට වඩා බිල්පත් වටිනාකම අඩු වන විට ඉතිරි මුදල ගැළපීම් නොකිරීම හේතුවෙන් කර්මාන්ත 24 ක අයි වෙන් කිරීම් රු.2,473,276 ක් ණයහිමියන් යටතේ තවදුරටත් දක්වා තිබුණි. | - එම - | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ --------------------- | | | |
| i. | 2016 මාර්තු 17 දිනැති අංක මප/පා.පා.කො/2016/03 දරන චක්‍රලේඛය | ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුවක් ලබා ගැනීමකින් තොරව කඩ කාමර 37 ක 2014 වර්ෂයේදී ආදායම් පරීක්ෂකවරයෙකු විසින් තක්සේරු කරන ලද කුලී සමාලෝචිත වර්ෂය වන විටද අයකරමින් පැවතුණි. | කඩ කාමර 37 වෙනුවෙන් මේ දක්වා තක්සේරු වාර්තා ඉදිරිපත් කර නොමැති බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| ii. | 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන චක්‍රලේඛය | වරිපනම් දේපල වසර 05කට වරක් තක්සේරුව සිදුකළ යුතු වුවද, 2008 වර්ෂයෙන් පසු සභා බල ප්‍රදේශයේ වරිපනම් දේපළ තක්සේරු කර නොතිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවට ඉල්ලුම් කර ඇතත් එම කාර්යය මේ දක්වා ඉටුවී නොමැති බව | - එම - |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,041,249 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,404,452 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තු ගත ආදායම රු. | බිල් කළ ආදායම රු. | රැස්කළ ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. | 2021 ඇස්තමේන්තු ගත ආදායම රු. | බිල් කළ ආදායම රු. | රැස්කළ ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| (i) | වරිපනම් හා බදු | 3,495,000 | 3,520,433 | 3,373,986 | 4,347,392 | 3,545,000 | 3,478,673 | 3,837,390 | 4,200,945 |
| (ii) | කුලී | 3,201,000 | 2,157,361 | 1,978,529 | 726,629 | 1,370,000 | 1,936,676 | 1,922,761 | 547,796 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,058,700 | 122,166 | 109,957 | 22,794 | 1,250,200 | 1,779,821 | 1,697,946 | 10,585 |
| (iv) | වෙනත් ආදායම් | 25,383,000 | 28,767,699 | 20,002,960 | 19,886,973 | 51,739,720 | 20,746,394 | 45,128,066 | 11,122,234 |
| | | 34,137,700 | 34,567,659 | 25,465,432 | 24,983,788 | 57,904,920 | 27,941,564 | 52,586,163 | 15,881,560 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| i. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවුරුදු 05 ට වැඩි කාලයක් පවතින එකතුව රු.1,429,654 ක හිඟ වරිපනම් සහ අයිතිකරු හඳුනා නොගත් දේපල 433 කින් රු.1,106,278 ක වරිපනම් අයකරගෙන නොතිබුණි. | රජයේ දෙපාර්තමේන්තු වලින් අය විය යුතු මුදල් සඳහා සභා නීතිඥ මහතා මඟින් එන්තරවාසි යැවීමට කටයුතු කර ඇති බව සහ හඳුනා නොගත් දේපල හඳුනාගනිමින් හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අය කිරීමට පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| ii. සභාව සතු ඉඩම් කැබලි 40 ක බදුකරුවන්ගෙන් මාස 04 සිට මාස 155 දක්වා කාල පරාසයකට අදාළව රු.137,429 ක බදු කුලී අයකරගෙන නොතිබුණි. | මෙම ඉඩම් බදු දීමේදී නුවරඑළිය ප්‍රාදේශීය සභාව විසින් නීත්‍යානුකූල ක්‍රමවේදය අනුගමනය නොකර ඇති හෙයින් එම මුදල් අයකරගැනීමට ගැටලුකාරී තත්ත්වයක් මතුව ඇති බව | හිඟ ආදායම් අය කළ යුතුය. |
| **(ආ) කුලී** | | |
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට කඩ කාමර 41 ක මාස 01 සිට 22 දක්වා කාල පරාසයකට අදාළව රු.361,267 ක කඩකුලී අයකර නොතිබුණි. | හිඟ මුදල් කඩිනමින් අය කර ගන්නා බව | හිඟ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

(ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු
-------------------------------

| | |
|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.6,822,415 ක් හා මුද්දර ගාස්තු රු.13,064,558ක් විය. | ප්‍රධාන ලේකම්ගෙන් ප්‍රතිපූර්ණය කර ගන්නා බව | ආදායම් ගෙන්වා ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා පනතේ 93 සිට 95 දක්වා වගන්ති වලට අනුව මල ප්‍රවාහනය සහ කසල ශෝධනය ප්‍රාදේශීය සභාව විසින් ඉටුකළ යුතු නමුත්, සභාව ආරම්භ කර වසර 4 ක කාලයක් ගතවී තිබුණද, ගලි රථ සේවාවක් සභාව සතුව නොතිබුණි. | ගලි බවුසර රථයක් ලබා ගැනීම සඳහා සභාවේ මූල්‍යය සම්පත් නොමැති බව | පනතේ කාර්යයන් ඉටුකළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභා පනතේ 27 වන වගන්තිය අනුව සමාලෝචිත වර්ෂය තුළ මංමාවත් ඉදිකිරීම , වැඩිදියුණු කිරීම සඳහා සභා අරමුදලින් කිසිඳු මුදලක් යොදවා නොතිබුණු අතර මාර්ග ගැසට් කිරීමටද කටයුතු කර නොතිබුණි. | මංමාවත් ඉදිකිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා සභා අරමුදලෙන් වෙන් කිරීමට කටයුතු කරන බව | පනතේ කාර්යයන් ඉටුකළ යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය සභා පනතේ 79 හා 80වගන්ති ප්‍රකාරව පොදු කානු ඉදිකළ යුතු වුවත්,කොටගල වනිගසේකරපුර නිවාස හරහා ගමන් කරන කානු පද්ධතිය වසර 50ක කාලයක් තුළ අළුත්වැඩියා කර නොතිබුණි .භෞතිකව පරීක්ෂා කරන අවස්ථාවේදී කාණු පද්ධතිය ඉතා අබලන් තත්ත්වයක පැවතුණි . | මෙම කානු පද්ධතිය ඉදිකිරීම සඳහා ඉතා විශාල මුදලක් වැය කිරීමට සිදුවන බැවින් සභාවේ මූල්‍ය ප්‍රමාණය අනුව ඒ ඒ අවස්ථාව මත ඇස්තමේන්තු සකස් කර ක්‍රියාත්මක කිරීමට අදහස් කරන බව | අළුත්වැඩියා කිරීමට පියවර ගත යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැසිකිලි 05 ක් සඳහා ඔප්පු හා සැලසුම් නොමැති වීම හේතුවෙන් වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. | වැසිකිලි හඳුනාගෙන ගිණුම්ගත කරන බව | වැසිකිළි වත්කම් ලේඛනයට ඇතුළත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2015 වර්ෂයේදී සිදුකළ ඉඩම් වෙන්දේසියකින් පොදු ඉඩමක් ලෙස භාවිතා කිරීම සඳහා සභාවට ලැබී තිබුණු පර්චස් 160 ක ආගයිල් ප්‍රදේශයේ තේ වගාව සහිත ඉඩම සභා වියදමින් දැල් වැටක් සවි කොට සභාවේ සේවකයින් යොදා තේ කප්පාදු කොට තිබුණි. සභාව විසින් නිසි ලෙස නඩත්තු කර පවත්වාගෙන යන මෙම ඉඩමේ ආදායම් පසුගිය වසර 07ක් තුල බාහිර පුද්ගලයෙකු විසින් ලබාගෙන තිබුණද, ඒ පිළිබඳ සැලකීමකින් තොරව මෙම ඉඩමෙන් කිසිඳු ආදායමක් සභාවට නොලැබෙන බව දක්වා ඉඩම තිස් අවුරුදු පදනමට බදු දීමට සභාවේ අනුමැතිය ලබා ගෙන තිබුණි . | ඉදිරියේදී විනිවිදභාවයෙන් යුක්තව පුවත්පත් දෙකක දැන්වීම් පළ කර ටෙන්ඩර් කර පිළිගත් ටෙන්ඩර් කරුවෙකු තෝරා ගන්නා බව | සභාවේ ආදායම් නිසි ලෙස රැස් කර ගැනීමට කටයුතු කළ යුතු අතර ඉඩම සභාවට පවරා ඇති අරමුණට අනුව කටයුතු කළ යුතුය. |

## 3.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පතන සන අපද්‍රව්‍ය කළමනාකරණ අංගනයට යාබද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් කොටසක අනවසරයෙන් වගා කටයුතු සිදුකරන පුද්ගලයින් දෙදෙනකුට කොම්පොස්ට් අංගනය හරහා ප්‍රවේශ මාර්ගයක් ලබාදී තිබුණි. | හිටපු සභාපතිවරයා විසින් මේ සඳහා අවසරය ලබාදී ඇති බව | අනවසර පිවිසුම් මාර්ග ඉවත් කළ යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කසළ අංගනය සහිත ඉඩම පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම ප්‍රාදේශිය සභාවට පවරා ගැනීමට කටයුතු කරන බව | පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභා වෙනම ස්ථාපිත කිරීමෙන් පසු එම ප්‍රාදේශීය සභා සඳහා මූලික පහසුකම් සැපයීමේ අරමුණින් පළාත් පාලන අමාත්‍යාංශය මඟින් 2020 ඔක්තෝබර් 05 දින ලබා දුන් රු.1,192,670 ක කාර්යාල උපකරණ භාවිතයකින් තොරව කාර්යාලයේ බිම් මහලේ ගබඩාව තුළ ගබඩා කර තිබුණි. | කාර්යාලයක් නොමැති කමෙන් මෙම තත්ත්වය උදාවී ඇති බව | උපකරණ උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභාවට අයත් අගයිල් ක්‍රීඩාපිටිය භූමියේ කොටසක් අනවසරයෙන් පදිංචි කරුවන් අත්පත් කරගෙන තිබුණු අතර ක්‍රීඩාපිටිය වටා වැට මායිම් සකස් කර ආරක්ෂාව තහවුරු කර නොතිබුණි. | අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන බව | අනවසර පදිංචිවීම් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.5 ව්‍යාපෘති, කර්තව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා 2015 මැයි 11 දින රු.83,373,432 කට ගිවිසුම්ගතව ඉදිකිරීම් පවරා 2016 දෙසැම්බර් 31 දින වනවිට ඒ සඳහා රු.21,559,211ක් ගෙවීම්කර තිබුණි. පරිපාලන සහ තාක්ෂණික ගැටළු හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වනවිටත් එහි වැඩ අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි. | මධ්‍යම පළාතේ ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව මඟින් මෙම කාර්යය කර ගැනීමට කටයුතු කරන බව | ඉදිකිරීම් නිම කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.6 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.1,000,000 කට ඇස්තමේන්තු කර වාමස් කෝන්ක්‍රීට් මාර්ගය වාහන ගමනාගමනයට යොදා ගැනීමට හැකි වන ලෙස අඩි 08 ක පළලකින් යුතුව සංවර්ධනය කිරීමට සැලසුම් කර තිබුණද, මාර්ගයේ පළල අඩි 4 ½ ක් වුයෙන් අපේක්ෂිත අරමුණ ඉටු කරගැනීමට නොහැකි වී තිබුණි. | ඉදිරියේදී මෙම ස්ථානයේ කාණු පද්ධතියක් සකස් කර ගැනීම සඳහා සැලසුම් කර වතු නිවාස හා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ප්‍රතිපාදන ලබා ගැනීමට කටයුතු කරන බව | අපේක්ෂිත අරමුණු ඉටුවන අයුරින් ඇස්තමේන්තු සැකසිය යුතුය. |

## 3. 7 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ කාර්ය මණ්ඩලයේ තනතුරු 14 ක පුරප්පාඩු 38 ක් පැවතුණි. ඉන් සෞඛ්‍ය කම්කරු තනතුරු 17 ක් පුරප්පාඩුවී පැවතීම සභාවේ කසළ කළමනාකරණ කටයුතු ඉටු කිරීමේදී බාධාවක්ව පැවතුණි . | විගණනයේ දී පෙන්වා දී ඇති පරිදි අදාළ අඩුපාඩුකම් සපුරා ගැනීම සඳහා ඉහළ කළමනාකාරිත්වය දැනුවත් කර ඇති බව | පුරප්පාඩු සම්පූර්ණ කරවාගත යුතුය. |
| (ආ) | සේවය හැරගිය සේවකයෙකුගෙන් රු.201,720 ක ණය අයකර ගෙන නොතිබුණි. | ඇප අත්සන් කරගෙන ඇති අයගෙන් අයකර ගැනීමට කටයුතු කරන බව | ණය ශේෂ අයකළ යුතුය. |

## 3.8 වාහන පද්ධතිය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 අප්‍රේල් 05 දින අනතුරට පත්ව තිබු වාහනයක් සම්බන්ධව මුදල් රෙගුලාසි 104 (3) පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. | පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබෙන උපදෙස් අනුව කටයුතු කරන බව | පරීක්ෂණයන් සිදු කර අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුය. |
| (ආ) | නුවරඑළිය ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේදී ලබාදී තිබුණු වාහන 04ක අයිතිය පවරාගෙන නොතිබුණි. | වාහන සභාවට පවරා ගැනීම සඳහා අවශ්‍ය අයදුම්පත්‍රය නුවරඑළිය ප්‍රාදේශීය සභාවට යොමු කර ඇති බව | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඊ පළාත් පාලන ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා සභාවේ නිල වෙබ් අඩවියක් 2021 ජුනි 17 දින සිට නිර්මාණය කරමින් පැවතියද, සමාලෝචිත වර්ෂයේ අවසාන දින තෙක් එහි කටයුතු නිම කිරීමට කටයුතුකර නොතිබුණි. | සභාවට නිල වෙබ් අඩවියක් නිර්මාණය කරමින් පවතින අතර දැනට එම කාර්යය සියයට 80 ක් අවසන් කර ඇති බව | නිම කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 06 ක සියයට 07 සිට සියයට 47 දක්වාද, වියදම් විෂයයන් 06 ක සියයට 18 සිට සියයට සියය ඉක්මවා විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි. | මෙවැනි අඩුපාඩුකම් ඉදිරියේදී සිදු නොවීමට වග බලා ගන්නා බව | අවශ්‍යතාවය සලකා බලා අවධානයෙන් අයවැය පිළියෙල කළ යුතුය. |

### 4.3 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පතන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අංගනය තුළ කසළ ප්‍රතිචක්‍රීයකරණයක් සිදු වී නොතිබුණු අතර සියලුම කසළ මිශ්‍රව ලබාගෙන පරිසරයට බැහැර කර තිබුණි. පොලිතීන් හා ප්ලාස්ටික් විධිමත් පරිදි රැස්කර තබා ගැනීමට ස්ථානයක් සකස් කරගෙන නොතිබුණි. | අඩුපාඩුකම් නිවැරදි කරන බව | විධිමත් පරිදි ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කළ යුතුය. |